# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1998 අංක 18 දරන කර්මාන්තශාලා (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1998 අප්‍රේල් මස 16 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1998 අප්‍රේල් මස 17 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. 5.75 යි. තැපැල් ගාස්තුව : රු. 2.50 යි.

## 1998 අංක 18 දරන කර්මාන්තශාලා (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1998 අප්‍රේල් මස 16 වන දින.]

එල්.ඩී.-ඕ. 46/95.

**කර්මාන්තශාලා ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1998 අංක 18 දරන කර්මාන්තශාලා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. කෙටි නාමය.

**2.** (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) කර්මාන්තශාලා ආඥාපනතේ 22 වන වගන්තියේ (2) වන උපවගන්තියේ "රුපියල් එක් දහසක් නොඉක්මවන" යන වචන වෙනුවට "රුපියල් පනස් දහසක් නොඉක්මවන" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. 128 වන අධිකාරයේ 22 වන වගන්තිය සංශෝධනය කිරීම.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තියේ (12) වන උපවගන්තියේ "රුපියල් පන්සියයක් නොඉක්මවන" යන වචන වෙනුවට "රුපියල් විසිපන් දහසක් නොඉක්මවන" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තිය සංශෝධනය කිරීම.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 35 වන වගන්තියේ (4අ) උපවගන්තියේ "රුපියල් පන්සියයක් නොඉක්මවන" යන වචන වෙනුවට "රුපියල් විසිපන් දහසක් නොඉක්මවන" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 35 වන වගන්තිය සංශෝධනය කිරීම.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 36 වන වගන්තියේ (4අ) උපවගන්තියේ "රුපියල් පන්සියයක් නොඉක්මවන" යන වචන වෙනුවට "රුපියල් විසිපන් දහසක් නොඉක්මවන" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 36 වන වගන්තිය සංශෝධනය කිරීම.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 36අ වගන්තියේ (2) වන උපවගන්තියේ "රුපියල් පන්සියයක් නොඉක්මවන" යන වචන වෙනුවට "රුපියල් විසිපන් දහසක් නොඉක්මවන" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 36අ වන වගන්තිය සංශෝධනය කිරීම.

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 39 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "රුපියල් පන්සියයක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු අතර" යන වචනවල සිට ඒ වගන්තියේ අවසානය තෙක් වූ සියලු වචන වෙනුවට "රුපියල් විසිපන් දහසක් ප්‍රධාන ප්‍රඥප්තියේ 39 වන වගන්තිය සංශෝධනය කිරීම.

නොඉක්මවන දඩයකට යටත් විය යුතු අතර, ඔහු එසේ වරදකරු කරනු ලැබුවේ යම් කඩ කිරීමක් සම්බන්ධයෙන් ද, ඒ කඩ කිරීම වරදකරු කරනු ලැබීමෙන් පසුව ඔහු විසින් දිගට ම කර ගෙන යනු ලැබුවහොත්, 110 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, ඔහු තවදුරටත් වූ වරදකට වරදකරු විය යුතු ය. තව ද, ඒ සම්බන්ධයෙන් එසේ වරද දිගට ම කර ගෙන යනු ලබන එක් එක් දිනය සඳහා රුපියල් පන්සියයක් නොඉක්මවන දඩයකට ඔහු යටත් විය යුතු ය'' යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 60 වන වගන්තිය සංශෝධනය කිරීම.

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ 60 වන වගන්තියේ (4) වන උපවගන්තියේ "රුපියල් පන්සියයක් නොඉක්මවන'' යන වචන වෙනුවට "රුපියල් විසිපන් දහසක් නොඉක්මවන'' යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 61 වන වගන්තිය සංශෝධනය කිරීම.

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 61 වන වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(3) මේ වගන්තිය අදාළ වන යම් අනතුරක්, සේවයෙහි යොදවා ඇති තැනැත්තකුට සිදු වූ අවස්ථාවක සහ කර්මාන්ත ශාලවේ පදිංචිකරු, මියගිය හෝ තුවාල සිදු වූ තැනැත්තාගේ නියම සේවා යෝජකයා නොවන අවස්ථාවක, ඒ පදිංචිකරු හෝ කළමනාකරු හෝ (වත්තක කර්මාන්ත ශාලාවක් සම්බන්ධයෙන් වන විට) වතු අධිකාරිවරයා විසින් අනතුර පිළිබඳ ලිඛිත දැන්වීමක් නියමිත යම් විස්තර ද සමග නියමිත ආකෘති පත්‍රයක, මියගිය හෝ තුවාල සිදු වූ තැනැත්තාගේ නියම සේවා යෝජකගෙන් ලබා ගෙන, අනතුර පිළිබඳ ඒ දැන්වීම දිස්ත්‍රික් කර්මාන්ත ශාලා පරීක්ෂා කිරීමේ ඉංජිනේරුවරයා වෙත යැවීමට වහාම කටයුතු සැලැස්විය යුතු ය''.

ප්‍රධාන ප්‍රඥප්තියේ 63 වන වගන්තිය සංශෝධනය කිරීම.

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 63 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "රුපියල් දහයක ගාස්තුවකට'' යන වචන වෙනුවට "රුපියල් දෙසීයක ගාස්තුවකට'' යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ "රුපියල් පනහක් නොඉක්මවන" යන වචන වෙනුවට "රුපියල් පන්සියයක් නොඉක්මවන" යන වචන ආදේශ කිරීමෙන්.

11. ප්‍රධාන ප්‍රඥප්තියේ 65 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (උ) ඡේදයේ "රුපියල් එක් සියයක් නොඉක්මවන" යන වචන යෙදෙන කවර හෝ අවස්ථාවක ඒ වචන වෙනුවට "රුපියල් පන් දහසක් නොඉක්මවන" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 65 වන වගන්තිය සංශෝධනය කිරීම.

12. ප්‍රධාන ප්‍රඥප්තියේ 81 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඉ) ඡේදයේ "රුපියල් පනහක් නොඉක්මවන" යන වචන වෙනුවට "රුපියල් දෙදහස් පන්සියයක් නොඉක්මවන" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 81 වන වගන්තිය සංශෝධනය කිරීම.

13. ප්‍රධාන ප්‍රඥප්තියේ 87 වන වගන්තියේ (4) වන උපවගන්තියේ "රුපියල් එක් සියයක් නොඉක්මවන" යන වචන වෙනුවට "රුපියල් පන් දහසක් නොඉක්මවන" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 87 වන වගන්තිය සංශෝධනය කිරීම.

14. ප්‍රධාන ප්‍රඥප්තියේ 90 වන වගන්තියේ (3) වන උපවගන්තියේ "රුපියල් පනහක් නොඉක්මවන" යන වචන වෙනුවට "රුපියල් දෙදහස් පන්සියයක් නොඉක්මවන" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 90 වන වගන්තිය සංශෝධනය කිරීම.

15. ප්‍රධාන ප්‍රඥප්තියේ 101 වන වගන්තියේ (4) වන උපවගන්තියේ "රුපියල් පනහක් නොඉක්මවන" යන වචන වෙනුවට "රුපියල් දෙදහස් පන්සියයක් නොඉක්මවන" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 101 වන වගන්තිය සංශෝධනය කිරීම.

16. ප්‍රධාන ප්‍රඥප්තියේ 109 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :-

ප්‍රධාන ප්‍රඥප්තියේ 109 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"ප්‍රකාශිත දණ්ඩනයක් සඳහා විධිවිධාන සලසා නොමැති වැරදි සම්බන්ධයෙන් දඩ මුදල්.

109. (1) මෙහි මින් මතු විධිවිධාන සලසා ඇති ආකාරයට යටත් ව කිසිම ප්‍රකාශිත දණ්ඩනයක් නියම කර නොමැති මේ ආඥාපනත යටතේ වූ යම් වරදක් සම්බන්ධයෙන් වරදකරු වන යම් තැනැත්තකු—

(අ) පළමුවරට සිදු කරන ලද වරදක් සම්බන්ධයෙන් වන විට, රුපියල් පන්දහසකට අඩු නොවන දඩයකට ;

(ආ) ( (2) වන උපවගන්තියේ සඳහන් දිගට ම සිදු කරගෙන යනු ලබන වරදක් සම්බන්ධයෙන් වන වරදක් නොවන) දෙවන වරට සිදු කරන ලද වරදක් සම්බන්ධයෙන් වන විට, රුපියල් පන්දහසකට අඩු නොවන, එහෙත් රුපියල් දොළොස් දහස් පන්සියයක් නොඉක්මවන දඩයකට ;

(ඇ) ( (2) වන උපවගන්තියේ සඳහන් දිගට ම සිදු කරගෙන යනු ලබන වරදක් සම්බන්ධයෙන් වන වරදක් නොවන) තුන්වන වරට හෝ තදනන්තරව සිදු කරන ලද වරදක් සම්බන්ධයෙන් වන විට, රුපියල් දොළොස් දහස් පන්සියයක් ඉක්මවන එහෙත් රුපියල් විසිපන් දහසක් නොඉක්මවන දඩයකට

යටත් විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් වරදකට වරදකරු කරනු ලැබ, දඬුවම් කරනු ලැබූ යම් තැනැත්තකු, ඔහු එසේ වරදකරු කරනු ලැබ දඬුවම් කරනු ලැබුවේ යම් කඩ කිරීමක් සම්බන්ධයෙන් ද ඒ කඩ කිරීම දිගට ම කරගෙන යනු ලබන අවස්ථාවක, ඔහු (110 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව) තවදුරටත් වූ වරදකට වරදකරු වන අතර, ඒ සම්බන්ධයෙන් ඒ කඩ කිරීම දිගට ම සිදු කරගෙන යනු ලබන එක් එක් දිනය සඳහා රුපියල් පන්සියයක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 110 වන වගන්තිය සංශෝධනය කිරීම.

**17.** ප්‍රධාන ප්‍රඥප්තියේ 110 වන වගන්තියේ "රුපියල් පනහක් නොඉක්මවන" යන වචන වෙනුවට "රුපියල් පන්සියයක් නොඉක්මවන" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**18.** ප්‍රධාන ප්‍රඥප්තියේ 111 වන වගන්තියේ "රුපියල් එක් දහසක් නොඉක්මවන" යන වචන වෙනුවට "රුපියල් එක් ලක්ෂයක් නොඉක්මවන" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 111 වන වගන්තිය සංශෝධනය කිරීම.

**19.** ප්‍රධාන ප්‍රඥප්තියේ 112 වන වගන්තියේ "රුපියල් පනහක් නොඉක්මවන" යන වචන වෙනුවට "රුපියල් පන්සියයක් නොඉක්මවන" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 112 වන වගන්තිය සංශෝධනය කිරීම.

**20.** ප්‍රධාන ප්‍රඥප්තියේ 113 වන වගන්තියේ "රුපියල් එක් දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස තුනක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකට" යන වචන වෙනුවට "රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 113 වන වගන්තිය සංශෝධනය කිරීම.

**21.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වුවහොත් සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.